**ශීර්ෂය 236- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව - 2025**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2026 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය (සංශෝධිත පරිදි) ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජූනි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50(II) අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවද පුනරාවර්තන වැය විෂයයන් 19කට අදාළව රු.44,322,133ක් හා මූලධන වැය විෂයයන් 02කට අදාළව රු.1,365,344ක් වූ ප්‍රතිපාදන සියයට 21ත් සියයට 100ත් අතර පරාසයකින් ඉතිරිවීම් සිදුකර තිබීම හේතුවෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිවැරදිව සිදුව නොතිබුණි. | වර්ෂය තුළදී මෘදුකාංග සංවර්ධනය අභ්‍යන්තරව සිදු කිරීමත්, නිලධාරීන් විදේශ ගමන්වල නිරත නොවීමත්, අන්තර් දීමනා සහ අනෙකුත් දීමනා නිලධාරීන්ගේ මූලික වැටුපට එකතු වීමත්, හැකි පමණින් e-mails මඟින් රාජකාරි කටයුතු ඉටු කිරීම හා ලිපිද්‍රව්‍ය නිකුත් කිරීම සීමාකිරීමත්, විදුලිය බිඳ වැටීම් අවමවීම නිසා ජෙනරේටරය භාවිතය අවම වීමත්, වාහන භාවිතය අවම කිරීම හා වාහන නඩත්තු නිසි ලෙස සිදු කිරීමත්, යන්ත්‍ර අලුත්වැඩියාව සීමා කිරීමත් හේතුවෙන් ප්‍රතිපාදන ඉතුරු වී ඇත. | මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කළයුතු අතර සලසා ගත් ප්‍රතිපාදන සැලසුම් සහගතව අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට වැය කළ යුතුය. |

## 3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවට අයත් වාහන සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂය සඳහා ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොමැත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වාහනවල ඉන්ධන පරීක්ෂාව නියමිත පරිදි සිදු කළ යුතුය. |
| (ආ) | 2024 නොවැම්බර් 25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය. 4.1.2 ඡේදය | වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම තුළ සියලුම යෝජිත ප්‍රසම්පාදන ඇතුළත්ව තිබිය යුතු වුවද ආරක්ෂක සේවා සහ පවිත්‍රතා සේවා ප්‍රසම්පාදන, 2025 ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | 2026 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී ආරක්ෂිත සේවා සහ පවිත්‍රතා සේවා යන ප්‍රසම්පාදනයන්ද ඇතුළත් කර පිළියෙල කර ඇති බව | මාර්ගෝපදේශ ප්‍රකාර එළඹෙන මූල්‍ය වර්ෂය තුල සිදුකල යුතු සියළු ප්‍රසම්පාදනයන් නිරූපණය කරමින් වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම සකස් කල යුතුය. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ අරමුණු 7 යටතේ වූ ක්‍රියාකාරකම් 31ක් සම්බන්ධයෙන් ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ක්‍රියාකාරකම් 5ක් අපේක්ෂිත භෞතික ප්‍රගතියෙන් සියයට 50ක් හෝ ඊට අඩුවෙන් ලඟාකර තිබුණි. | 2025 වර්ෂය තුල සකස් කිරීමට නියමිතව තිබූ අධි ලේඛන විද්‍යාව පිළිබඳ ත්‍රෛභාෂික පදමාලාව සියයට අසූවක ප්‍රගතියක් ළඟා කර ගන්නා ලදී. දිවයිනට බලපෑ දිට්යා ආපදා තත්වය මත ආයතන කාර්යබහුල වීම හේතුවෙන් සංස්කරණ කටයුතු සිදුකිරීම සඳහා ආයතනවලට ලබාදී තිබුණු පදමාලාවන් අවසන් කර “ටර්මිනෝ හබ්” වෙබ් අඩවිය වෙත මුදාහැරීමේ කටයුතු 2026 දෙසැම්බර් 31 දින වන විට සිදු කිරීමට රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්තුමා විසින් අනුමැතිය ලබා දී ඇත. | ආයතනයේ අරමුණු ළගා කරගැනීම සඳහා හඳුනා ගන්නා ලද ක්‍රියාකාරකම් උපරිමයෙන් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 4.2 වෙනත් නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමසාරිස් ජනරාල් කාර්යාලයේ පැන්ට්‍රි කබඩ් හා කොමසාරිස් නිල කාමරයේ ඉදිරිපස කොටස නවීකරණය සඳහා 2025 ඔක්තෝබර් 21 දින පැවති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් රු.1,080,940 (වැට් රහිත) ක මුදලකට සේවා ආයතනයක් තෝරාගෙන තිබූ අතර එම තෝරාගත් ආයතනය සමඟ කොන්ත්‍රාත් ගිවිසුම ඊට දින 6කට පෙර එනම් 2026 ඔක්තෝබර් 15 දින අත්සන් කර තිබුණි. | කොමසාරිස් ජනරාල් කාර්යාලයේ පැන්ට්‍රි කබඩ් හා කොමසාරිස් නිල කාමරයේ ඉදිරිපස කොටස නවීකරණය සම්බන්ධව ලංසු ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගන්නා ලද ආයතනය සමඟ ගිවිසුම්ගත වීමේදී අතපසු වීමකින් කොන්ත්‍රාත් දිනය සටහන් කර ඇති අතර, ඉදිරියේදී එවැනි අතපසු වීම සිදු නොවීමටත්, ප්‍රසම්පාදන කාර්යයන් නිසි පරිදි සිදු කිරීමටත් කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත් කාර්යයන් විනිවිද භාවයෙන් යුතුව මාර්ගෝපදේශ ප්‍රකාරව සිදුකළ යුතුය. |

## 4.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ විභාග සඳහා අවශ්‍ය වන හඬපට පටිගත කිරීම සඳහා රු.2,426,125 ක් වැය කරමින් 2017 වර්ෂයේ ශබ්දාගාරයක් ඉදිකර තිබුණි. මෙම ශබ්දාගාරය 2025 වර්ෂයේ යොදාගෙන තිබුණේ ජාතික භාෂා සුදුසුකම් ඇගයීම් පරීක්ෂණ 2 ක් සඳහා අවශ්‍ය හඬපට සැකසීම සඳහා පමණක් වීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 (ii) හා 01/2026 හි විධිවිධාන අනුව නැවතත් රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණ පැවැත්වීමට නියමිත බැවින් එම පරීක්ෂණයේ ශ්‍රවණ කුසලතා පරීක්ෂණය සඳහා ඉදිරි කාලයේදී යළිත් විශාල වශයෙන් හඬපට සැකසීමට සිදුවේ . | වත්කම් උපරිම ලෙස උපයෝජනය සඳහා සැලසුම් සහගතව කටයුතු කළ යුතුය. |
| (ආ) | භාෂා විද්‍යාගාරය තුළ සර්වරයක් සහිත මොනිටර් 30 ක් ද, භාෂා ඇගයීමේ මධ්‍යස්ථානය තුළ පරිගණක 11 ක්ද තවත් දේශන ශාලාවක සර්වරයක් සහිත මොනිටර් 30 ක් ද පැවතුණු අතර 2025 වර්ෂය තුල දෙපාර්තමේන්තුව මගින් සහතිකපත්‍ර පාඨමාලා 01ක් පමණක් මෙම දේශන ශාලා හා භාෂා විද්‍යාගාරය තුල පවත්වා තිබුණු අතර වෙනත් කිසිදු පාඨමාලාවක් පවත්වා නොතිබුණි. ඒ අනුව මෙම දේශන ශාලා 2025 වර්ෂය තුල ද ඌන උපයෝජිතව පැවතුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 නිකුත්වීමත් සමඟ සිංහල හා දෙමළ භාෂා පාඨමාලා දීප ව්‍යාප්තව පැවැත්වීම හේතුවෙන් හා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඉගැන්වීමත්, භාෂා විද්‍යාගාරය තුළ පවත්වන ලද භාෂා පාඨමාලා සඳහා සහභාගී වන සිසුන් සංඛ්‍යාව අඩුවීම හේතුවෙන් භාෂා පාඨමාලා පැවැත්වීම අඩු විය. | භාෂා විද්‍යාගාරය, ඇගයීම් මධ්‍යස්ථාන, දේශන ශාලා, පරිගණක හා උපකරණ යනාදී වත්කම් උපරිම ලෙස උපයෝජනයට සැලසුම් සහගතව ක්‍රියාත්මක විය යුතුය. |

## 4.4 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිරිවැය රු.10,810,000 ක් වූ, මොරටුව විශ්ව විද්‍යාලය විසින් සකස් කර දුන් සිංහල-දෙමළ හා දෙමළ-සිංහල භාෂා පරිවර්තන මෘදුකාංගය පරිශීලකයින් 225 කට ආසන්න පිරිසක් භාවිතා කරන බව දක්වා තිබුණද විද්‍යුත් ලිපිනයට තොරතුරු කැඳවීමේදී කිසිවකු එය භාවිතා කර නොතිබුණි. | භාෂා පරිවර්තක මෘදුකාංගය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් සර්වරයක පවත්වාගෙන යමින් පරිශීලකයන් 225 දෙනෙකුට ආසන්න ප්‍රමාණයකට භාවිතය සඳහා ලබාදී ඇති බැවින් විශ්ව විද්‍යාලය වෙත ගෙවන ලද මුදලට සරිලන මෘදුකාංගයක් නිර්මාණය කර දී ඇත. සංවර්ධනය කර ඇති මෘදුකාංගයට වඩා නිවැරදි සහ | කාලීනව සිදුවන වෙනස්කම් වලට අනුරූපීව පවතින මෘදුකාංගය සංවර්ධනය කර ගනිමින් අපේක්ෂිත අරමුණු හා කාර්යයන් සඳහා සක්‍රීය ලෙස යොදා ගැනීමට ක්‍රියාකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | භාෂා පරිවර්තක මෘදුකාංග දැනට වෙළඳපොළේ පවතින බැවින් පරිශීලකයන් එකී මෘදුකාංග භාවිතයට පෙළඹී ඇත. | |
| (ආ) | 2018- 2019 වර්ෂවල භාෂා ප්‍රවීනතා පාඨමාලා සඳහා මුද්‍රණය කර තිබූ රු.2,236,978 ක් වටිනා උපකාරක පාඨමාලා ග්‍රන්ථ 14,984 ක්, විවිධ වර්ගවල රු.263,658ක් වටිනා ටෝනර් 19 ක් හා වටිනාකම හඳුනා නොගත් ටෝනර් වර්ග 04ක් ද 2025 වර්ෂයේදී භාවිතයෙන් තොරව පැවතුණි. | මෙම පොත් රජයේ ආයතන හා පාසල් පුස්තකාලවලට නොමිලේ නිකුත් කිරීමට හා ඉල්ලීම් අනුව බෙදාහැරීමටත් රෝනියෝ පේපර් (Ronio Paper) 22 හා CD Writing Pen 37 ඉදිරියේදී දෙපාර්තමේන්තුව විසින් භාවිතා කිරීමටත්, ෆැක්ස් රෝල් 8 භාවිතා කරනු ලබන යන්ත්‍ර මෙම දෙපාර්තමේන්තුවෙන් ඉවත්කර ඇති බැවින් වෙනත් රජයේ ආයතනවල අවශ්‍යතාවයන් විමසා නිකුත් කිරීමටත්, ගබඩාවේ පවතින ටෝනර් සම්බන්ධයෙන් අමාත්‍යාංශ තාක්ෂණ නිලධාරියාගේ වාර්තාව හා නිර්දේශ මත පදනම්ව ඉදිරි කටයුතු සිදුකිරීමටත් ක්‍රියාකරනු ලැබේ. | අවශ්‍යතාවයන් හඳුනාගෙන මිලදී ගැනීම් කලයුතු අතර අනවශ්‍ය මිලදී ගැනීම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. පවත්නා අතිරික්ත තොග අයිතම සම්බන්ධව ඉදිරි අවශ්‍යතා ඇතිවන අංශ හඳුනාගෙන උපයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 194 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 5 ක්ද, තෘතීයික මට්ටමේ තනතුරු පුරප්පාඩු 38 ක්ද, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 24ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 2ක් වශයෙන් පුරප්පාඩු 69 ක් පැවතුන අතර කාර්යය මණ්ඩල අවශ්‍යතා කාලීනව සමාලෝචනය කර පුරප්පාඩු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | කොමසාරිස් /නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 02 ක් බඳවා ගැනීම සඳහා විභාගය පැවැත්වීමට කටයුතු සිදු කරමින් සිටින අතර භාෂා පරිවර්තක අධිකාරි සහ භාෂා අධිකාරි බඳවා ගැනීමේ පටිපාටීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යොමු කර ඇත. | කාර්යය මණ්ඩල අවශ්‍යතා කාලීනව සමාලෝචනය කර ප්‍රශස්ත කාර්ය මණ්ඩලයක් පවත්වා ගත යුතුය. |